# පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය උපාධිධරයින්ගේ සංගමය

# අධ්‍යාපන අර්බුදය විසඳීමේ කඩිනම් අවශ්‍යතාව

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ සුබසාධනය උදෙසා කැපවුණු පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය උපාධිධරයින්ගේ සංගමය විසින් ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙහි මෙන්ම උසස් අධ්‍යාපනය සඳහා සිසුන් යොමු කරවන ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි හටගෙන තිබෙන තත්ත්වය පිළිබඳ ගැඹුරින් අවධානය යොමු කරනු ලැබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය මෙන්ම ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලද ශුද්ධ හා ව්‍යවහාරික විද්‍යා, සමාජයීය විද්‍යා, වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු, නීතිය සහ සෞන්දර්යය අධ්‍යයන ආදී සෑම ක්ෂේත්‍රයකම නායකයින් බිහි කර තිබෙන අතර තවදුරටත් ඊට දායක වෙමින් සිටී. ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් විශිෂ්ට දායකත්වයක් සැපයූ සහ සපයමින් සිටින කුශලතා පූර්ණ විවිධ වෘත්තිකයින් පෝෂණය කරනු වස් මෙම පද්ධතිය විශිෂ්ට දායකත්වයක් සපයා තිබේ. සමාජයේ සෑම ක්ෂේත්‍රයකටම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව පැවති බැවින් මෙම කාර්යය ප්‍රායෝගික වී තිබේ. සීමිත සම්පත් සහිත කුඩා රාජ්‍යයක් වුවද ශ්‍රී ලංකාව ජනතාවට උසස් ජීවන මට්ටමක් සහ සෞඛ්‍ය තත්ත්වයක් පවත්වා ගැනීමට නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රතිලාභ ලද රටක් සඳහා කදිම නිදසුනකි.

රාජ්‍ය අධ්‍යාපනය සඳහා කෙරෙන ආයෝජනය ඉහළ නැංවීම පිණිස රජයේ අවධානය යොමු කරවීම ඉලක්ක කර ගනිමින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය විසින් අරඹන ලද වැඩ වර්ජනය එහි සත්වන සතියට එළඹ තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික අධ්‍යාපනයෙහි අනාගතයට අතිශය වැදගත් වන මෙම ගැටලු නිරාකරණය කරගනු පිණිස විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය සමග අර්ථවත් සාකච්ඡාවක නිරතවන ලෙස පේරාදෙණිය විශ්වද්‍යාලයීය උපාධිධරයින්ගේ සංගමය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙක් සහ උසස් අධනපන අමාත්‍යංශයෙන් ඉල්ලීමක් සිදු කෙරේ. ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉහළ ගුණත්වයකින් යුක්ත විද්‍යාර්ථීන් පිරිසක් බඳවා ගැනීමට හා රඳවා තබා ගැනීමට ඇති හැකියාව සහ ඔවුනගේ වැටුප් තල කෙරෙහි අවධානය යොමු කිරීම අතිශය වැදගත් කරුණු වේ.

උසස් පෙළ විභාගයට පෙනී සිටි සිය ගණනක් සිසුන් තුළ සහ ඔවුන්ගේ පවුල්වල දැඩි කම්පනයක් හා අප්‍රමාණ පීඩාවක් ඇති කළ ඉසඩ් ස්කෝර් (z-score) ගැටලුව සඳහා කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙසද පේරාදෙණිය විශ්විද්‍යාලයීය උපාධිධරයින්ගේ සංගමය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සහ උසස් අධ්‍යාපන අමාත්‍යංශයෙන් ඉල්ලා සිටී.

සෑම පාර්ශවයකටම එකඟ විය හැකි සාධාරණ හා ක්‍රමවත් ආකාරයකින් අධ්‍යාපනයෙහි පැන නැගී ඇති වර්තමාන ගැටලු විසඳීමට දායක වන ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය උපාධිධරයින්ගේ සංගමය සියලු බලධාරීන්ගෙන් හා අධිකාරිත්වයෙන් ඉල්ලා සිටී.

මහාචාර්ය සාවිත්‍රී කුමාර්

සභාපති

උපාධිධරයින්ගේ සංගමය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය